# දේවත්වය පිළිබඳ ප්‍රශ්න 60 ක් බයිබලයේ පිළිතුරුද සමඟ.

# [60 Questions on the GODHEAD with Bible Answers]

01. ත්‍රිත්වය යන වචනය බයිබලයේ සඳහන් වේද? **නැත.**

02. දේවත්වයේ කීපදෙනෙකු ඇති බව බයිබලය සඳහන් කරයිද? **නැත.**

03. පියා, පුත්‍රයා හා ශුද්ධාත්මය ගැන බයිබලය සඳහන් කරයිද? **ඔව්.**

04. මතෙව් 28:19 සඳහන් තනතුරු වලින් පැහැදිලි වන්නේ එකිනෙකාට වෙනස් පුද්ගලයින් තිදෙනෙක් දේවත්වයේ සිටින බවද? **නැත**. එයින් සඳහන් වනුයේ මනුෂ්‍යාකාරයෙන් සම්බන්ධ නැදෑකම, තනතුරු නැතහොත් චරිතය වේ.

05. බයිබලයෙහි දෙවියන් වහන්සේ ගැන සඳහන් කරන විට තුන යන වචනය පාවිච්චි වේද? මුළු බයිබලයේම එකම තැනක පමණක් එසේ සඳහන් වේ. 1 යොහාන් 5:7 එහි පියා, පුත්‍රයා වෙනුවට වචනය සහ ශුද්ධාත්මය යන්න සඳහන් කොට ඇත. "**මේ තිදෙනාම එක් අයෙකි**" යි එහිම සඳහන්ය.

06. බයිබලය දෙවියන්වහන්සේ ගැන සඳහන් කරන විට එක යන වචනය භාවිත කරයිද? **ඔව්**, බොහෝ තැන් එසේ සඳහන් කර ඇත. උදාහරණයක් වශයෙන් සෙකරියා 14:9 , මලාකි 2:10 , මතෙව් 23:9 , මාර්ක් 12:29,32 , යොහාන් 8:41 , 10:30, රෝම 3:30, 1 කොරින්ති 8:4, ගලාති 3:20, 1 තිමෝති 2:5 , යාකොබ් 2:19.

07. දේවත්වයේ අභිරහස තේරුම් ගත හැකිද? **ඔව්.** රෝම 1:20, කොලොස්සි 2:9, 1 තිමෝති 3:16.

08. ක්‍රිස්තු භක්තිකයාට සිටින්නේ එකම ස්වර්ගික පියෙක් පමණක්ද? **ඔව්.** මතෙව් 23:9.

09. එසේ නම් යේසුස් වහන්සේ පිලිප්පිට මෙසේ කීවේ ඇයි? "මා දුටු තැනැත්තේ පියාණන්වහන්සේද දැක තිබේ." (යොහාන් 14:9) යේසුස් වහන්සේ යනු දෙවියන් වහන්සේගේ දෘෂ්‍යමාණ රූපාකාරය වේ. හෙබ්‍රෙව් 1:3.

10. දේවත්වයේ දෙදෙනෙකු සිටිතැයි බයිබලයේ සඳහන් වේද? **නැත.**

11. දේවත්වය මුළුමනින්ම එක් තැනැත්තකු තුලින් ප්‍රකාශ වූ බව බයිබලය සඳහන් කරයිද? **ඔව්.** ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුලය. 2 කොරින්ති 4:4, කොලොස්සි 1:19, 2:9, හෙබ්‍රෙව් 1:3.

12. දේවත්වය පිළිබඳ සත්‍ය ඇතමුන්ගෙන් සැඟවී ඇත්ද? **ඔව්.** ලූක් 10:21-22.

13. පියාණන් වහන්සේ කවුරුන්ද? **ඒ එකම දෙවියන් වහන්සේය**. මනුෂ්‍යත්වයට සම්බන්ධ පීතෘ සම්බන්ධය එයින් ප්‍රකාශ වන්නේය. ද්විතීය කථාව 32:6, මලාකි 2:10.

14. යේසුස් වහන්සේ පොළව මත සිටි කාලයේදී පිය වූ දෙවියන් වහන්සේ කොහි සිටි සේක්ද? පියාණන් වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ තුල සිටිය සේක. යොහාන් 14:10, 2 කොරින්ති 5:19 දෙවියන් වහන්සේ සර්ව ව්‍යාපී බැවින් උන්වහන්සේ ස්වර්ගයෙහි ද වැඩ සිටි සේක.

15. යේසුස් වහන්සේ පියාණන් වහන්සේ වන බව යෙසායා දිවැසිවරයා පැවසියේද? **ඔව්.** යෙසායා 9:6, 63:16.

16. "මිනිසා අපගේ ස්වරූපයෙන්ම මවමු" යි දෙවියන් වහන්සේ පවසා සිටියේ දේවත්වයෙහි තවත් අයකුටද? **නැත.** යෙසායා 44:24, මලාකි 2:10.

17. දෙවියන්වහන්සේගේ ගතිගුණ අතරින් කුමන ගතිගුණ ක්‍රිස්තුස් වහන්සේ තුළ තිබිණිද? **සියල්ලම** කොලොස්සි 2:9.

18. යේසුස් වහන්සේ මෙලොවට එවූ දෙවියන් වහන්සේ අප දකින්නේ කෙසේද? **යේසුස් වහන්සේ දැකීමෙනි**. යොහාන් 12:44-45 , 14:9.

19. යේසුස් වහන්සේ සර්වබලධාරී යයි බයිබලය කියයිද? **ඔව්.** එළිදරව් 1:8.

20. ත්‍රිත්වයේ පලමුවැන්නා වශයෙන් සමහරුන් නම් කරන්නේ කවුරුන්ද? පියාණන් වන දෙවියන් වහන්සේය.

21. ත්‍රිත්වයේ අන්තිමයා වශයෙන් සමහරුන් නම් කරන්නේ කවුරුන්ද? ශුද්ධාත්මයාණන්ය. එහෙත් යේසුස් වහන්සේ කියන්නේ උන්වහන්සේ පළමුවැනියාද අන්තිමයාද වන බවය. එළිදරව් 1:17-18.

22. ස්වර්ග රාජ්‍යයෙහි සිංහාසනාරූඪව සිටි, කී දෙනෙක් යොහාන්ට දක්නට ලැබුනේද? **එක් අයකු පමණයි** එළිදරව් 4:2.

23. යේසුස්වහන්සේ පළමුවැනියාත් අන්තිමයාත් නම්, යෙසායා 44:6 දී දෙවියන් වහන්සේම පලමුවැනියාත් අන්තිමයාත් බව ප්‍රකාශ කලේ ඇයි? යේසුස් වහන්සේ නම් පරණ ගිවිසුමේ දෙවියන් වහන්සේම මාංශවත් වීමයි.

24. දෙවියන් වහන්සේට පමණක් නමස්කාර කළ යුතු බව යේසුස් වහන්සේ යක්ෂයාට කී සේක්ද? **ඔව්.** මතෙව් 4:10

25. එක් දෙවිකෙනෙකුට වඩා වැඩි දෙනෙකු ගැන යක්ෂයා විශ්වාස කරයිද? **නැත.** යාකොබ් 2:19.

26. දෙවියන් වහන්සේ මිනිස් වෙසින් පෙනී සිටින්නේ යැයි බයිබලය කියයිද? **ඔව්.** යොහාන් 1:1,14.

27. දෙවියන්වහන්සේ (මිනිස් වෙසින්) මාංශවත්ව පෙනී සිටියේ කුමක් සඳහාද? පවුකාරයන් ගලවා ගැනීම සඳහාය. හෙබ්‍රෙව් 2:9, 14.

28. යේසුස් වහන්සේ යනු මාංශවත් වූ දෙවියන් වහන්සේද? **ඔව්.** 1 තිමෝති 3:16.

29. යේසුස් වහන්සේ එක විටම ස්වර්ගයෙහිත් පොළොවෙත් සිටිය හැකිද? **ඔව්.** යොහාන් 3:13.

30. එකම ස්වාමීන්වහන්සේ කෙනෙකු පමණක් සිටින බව බයිබලය කියයිද? **ඔව්.** යෙසායා 45:18, එපීස 4:5.

31. ක්‍රිස්තුස් වහන්සේ ස්වාමීන්වහන්සේම යයි බයිබලය කියයිද? **ඔව්.** ලූක් 2:11.

32. ස්වාමීන් වහන්සේ යනු දෙවියන් වහන්සේම යැයි බයිබලය කියයිද? **ඔව්.** 1 රාජාවලිය 18:39, සෙකරියා 14:5, ක්‍රියා 2:39, එළිදරව් 19:1.

33. දෙවියන් වහන්සේ තම මහිමය වෙන කෙනෙකුට දෙනු ලැබේද? **නැත.** යෙසායා 42:8

34. සභාව යේසුස් වහන්සේට අයත් වන ගමන්ම (මතෙව් 16:18) දෙවියන් වහන්සේගේ සභාව බවටද පත්වන්නේ කෙසේද? (1 කොරින්ති 16:32) යේසුස් වහන්සේ යනු ජීවමාන දෙවියන් වහන්සේම වන බැවිනි.

35. යෙහොවා වහන්සේට පෙර දෙවි කෙනෙකු සිටි සේක්ද? එසේම ඉන් පසුව දෙවි කෙනෙකු පහළ වන්නේද? **නැත.** යෙසායා 43:10.

36. දෙවියන් වහන්සේ නොදන්නා එකම දෙය කුමක්ද? **තවත් දෙවිකෙනෙකු ගැනය.** යෙසායා 48:8.

37. දෙවියන් වහන්සේට කළ නොහැකි එකම දෙය කුමක්ද? **බොරු කීම.** තීතස් 1:2

38. අප දැන ගත යුත්තේ දෙවිවරුන් කී දෙනෙක් ගැනද? **එක් දෙවි කෙනෙකු ගැන පමණයි.** හොෂෙයා 13:4.

39. දෙවියන් වහන්සේට නම් කීයක් තිබේද? **එකකි.** සෙකරියා 14:9.

40. දෙවියන් වහන්සේගේ නමින්ම උන්වහන්සේ ගැන සිතීම කළ යුතුද? **ඔව්.** මලාකි. 3:16

41. දෙවියන් වහන්සේ පමණක් සාගර රැල්ල මත ගමන් ගන්නා සේක්ද? **ඔව්.** යෝබ් 9:8

42. එසේ නම් ගලීලයේ මුහුද මත ඇවිදීමට යේසුස් වහන්සේට හැකි වූයේ කෙසේද? (මතෙව් 14:25) උන්වහන්සේ මැවුම්කාර දෙවියන්වහන්සේම වන බැවිනි. කොලොස්සි 1:16.

43. පව්කමාව දිය හැක්කේ දෙවියන් වහන්සේට පමණක්මද? **ඔව්.** යෙසායා 43:25, මාර්ක් 2:7.

44. මාර්ක් 2:5-11 හි සඳහන් පරිදි යේසුස් වහන්සේට පව්කමාව දිය හැකි වූයේ කෙසේද? උන්වහන්සේ ගැළවුම්කාර දෙවියන් වහන්සේම වන බැවිනි.

45. යේසුස් වහන්සේ යනු සත්‍යම වූ දෙවියන් වහන්සේද? **ඔව්.** 1 යොහාන් 5:20.

46. දෙවියන් වහන්සේ හා ශුද්ධාත්මය යනු වෙනත් තැනැත්තන් නම් ක්‍රිස්තුස්වහන්සේගේ පියාණන් කවරෙක්ද? මතෙව් 1:20 දැක්වෙන්නේ ශුද්ධාත්මය ම පියාණන් වූ බවය. එහෙත් රෝම 15:6. 2 කොරින්ති 11:31, එපීස 1:3 දැක්වෙන්නේ පියාණන් වූයේ දෙවියන් වහන්සේ බවය. පියාණන් වූ දෙවියන් වහන්සේත් ශුද්ධාත්මයත් යනු එකම ආත්මයත් බව තේරුම් ගත් විට මෙහි පැටලිල්ලක් ඇති නොවේ. මතෙව් 10:20 , එපීස 4:4 , 1 කොරින්ති 3:16.

47. ස්වාමිනී ඔබ කවුදැයි පාවුල්තුමා ඇසූ විට ඊට දුන් පිළිතුර කුමක්ද? **"මම යේසුස් වහන්සේ වෙමි"** යනුයි. ක්‍රියා 9:5.

48. ස්තේපන් මරණයට පත්වන අවස්ථාවෙහි දෙවියන් වහන්සේ යනු යේසුස් වහන්සේ බව කීවේහිද? **ඔව්.** ක්‍රියා 7:59.

49. යේසුස් වහන්සේ යනු දෙවියන් වහන්සේ බව තෝමස් ප්‍රකාශ කළේද? **ඔව්.** යොහාන් 20:28

50. "මා හැර වෙන ගැළවුම්කාරයෙකු නැත." යනුවෙන් යෙසායා 43:11 හි දක්වා ඇත්නම් යේසුස් වහන්සේ ගැළවුම්කාරයා වන්නේ කෙසේද? ක්‍රිස්තුස් වහන්සේ තුළම දෙවියන් වහන්සේද සිටි නිසාය. 2 කොරින්ති 5:19

51. යේසුස් වහන්සේ යනු අප සමඟ සිටින දෙවියන් වහන්සේ යයි බයිබලය කියයිද? **ඔව්.** මතෙව් 1:23

52. "මා ද මාගේ පියාණන්ද එක් කෙනෙකි." යි යේසුස් වහන්සේ කිසිදාක කියා ඇද්ද? **ඔව්.** යොහාන් 10:30.

53. ස්වාමි පුරුෂයාත් භාර්යාවත් දෙදෙනෙකු නොව එක් කෙනෙකියි කියූ අර්ථයෙන්ම යේසුස් වහන්සේත් පියාණන් වහන්සේත් එක් කෙනෙකියි ඔප්පු කළ හැකිද? **නැත.** දේවත්වය කිසිසේත්ම ස්වාමියා හා භාර්යාව අතර ඇති සම්බන්ධයට සමාන කළ නොහැකිය. යේසුස් වහන්සේ තම පියාණන් සමග එක් වූවාසේ ස්වාමියාටත් භාර්යාවටත් එක් වීමට නුපුළුවන. යොහාන් 14:9-11

54. එකම ඥානවන්ත දෙවිකෙනෙකු සිටී යයි බයිබලය කියයිද? **ඔව්.** යූද් 25.

55. ශුද්ධාත්මය යනු දේවත්වයේ දෙවන හෝ තෙවන තත්වය යයි බයිබලය කියයිද? **නැත.** ශුද්ධාත්මය යනු දෙවියන් වහන්සේගේ එකම ආත්මයකි. අපගේ ජීවිත වල ක්‍රියා කරන්නේ එම එකම දෙවියන් වහන්සේය. යොහාන් 4:24, 1 කොරින්ති 3:16-17, 6:19, 12:13.

56. යොහාන් විසින් යේසුස් වහන්සේ බවුතිස්ම කරනු ලබන විට දිව්‍යමය තැනැත්තන් තිදෙනෙකු සිටි බව ත්‍රිත්ව නිකායකයින්ට පෙන්විය හැකිද? කොහෙත්ම නොහැකිය. සෑම තැනකම සිටින එකම දෙවියන් වහන්සේ එකවර තුන් ආකාරයකින් දර්ශනය වූන සේක. සිටින්නේ එකම දිව්‍යමය තැනැත්තකු පමණි. එනම් ස්වාමීන් වහන්සේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේය.

57. ත්‍රිත්ව වාදීන් කතා කරන අනෙක් දෙදෙනා කවරහුද? එකක් නම් ස්වර්ගයෙන් නිකුත් වූ හඬයි. අනෙක නම් පරෙවියකුගේ ස්වරූපයෙන් පහළ වන දේවාත්මයයි. මතෙව් 3:16-17

58. යේසුස් වහන්සේගේ බවුතිස්මයේදී නැගුණු හඬ කුමක්ද? "නුඹ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය. නුඹ කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමියි" මාක් 1 : 11 යේසුස් වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා වශයෙන් ද පෙනී සිටිය එකම දෙවියන් වහන්සේය.

59. දෙවියන් වහන්සේ තම රුධිරය ගලා යාමට සැලැස්වූ බවත්, අප වෙනුවෙන් තම ජීවිතය පූජා කල බවත් බයිබලය කියයිද? ඔව්. ක්‍රියා 20:28 1 යොහාන් 3:16, දෙවියන් වහන්සේට එසේ කල හැකි වූයේ තමන් වහන්සේ විසින් සිරුරක් ලබා සිටි බැවින්.

60. දෙවියන් වහනසේ තම ශුද්දවන්තයන් සියලු දෙනාම සමඟ ආපසු පැමිණෙන සේකැයි බයිබලය කියයි. (සෙකරියා 14:5) යේසුස් වහන්සේ සියලු ශුද්ධවන්තයන් සමග ආපසු පැමිණෙන සේකැයි තවත් තැනක සඳහන් වේ.
(1තෙසලෝනික 3:13) දෙදෙනෙක් පැමිණෙන්නාහුද? **නැත.** ආපසු එන්නේ එක් අයකු පමණි. අපගේ ශ්‍රේෂ්ඨතම දෙවියන් වහන්සේ වන ගැළවුම්කාරයානන්ය. එනම් යේසුස් ක්‍රිස්තුස් වහන්සේය. (තීතස් 2:3)

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ හඳුනා ගැනීමට අපි අද ඔබට ආරාධනා කරමු.

**You are Invited to Know Jesus Today.**


**එක්සත් පෙන්ත කොස්ත සභාව,**
**නො. 1 ටෙම්ප්ලර් පෙදෙස, ගල්කිස්ස.**
**දුරකථන : 712615 , 716951**

Apostolische Pfingstgemeinde Mannheim
Friedelsheimerstr. 18-20
D - 68199 Mannheim (Neckarau) /Germany
Pastor Raymond Wey
Assistent Pastor Sascha Wey
www.jesus-is-god.de, www.v-p-m.de